# අතුරලිය ප්‍රාදේශීය සභාව
## <u>මාතර දිස්ත්‍රික්කය</u>.

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 25 දිනද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 මැයි 31 දිනද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට **අතුරලිය** ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේදී ලැබුණු රු.96,932 ක වෙනත් ආදායම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ බැරකම් ලෙස දක්වා තිබුණි. | මූල්‍ය හා මෙයෙහුම් ප්‍රකාශයේ ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ අවසානයට ගෙවිය යුතු රු.167,123 ක විවිධ වියදම් වෙනුවෙන් ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සලස්වා නොතිබුණි. | ණයහිමි ප්‍රතිපාදන නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේදී ස්ථාවර වත්කම් මිලට ගැනීම සඳහා දරන ලද රු.319,475 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | සියළුම ස්ථාවර වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කිරිමට කටයුතු කරමි. |

(ආ) **නොසැසඳුණු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු.55,298,443 ක් වූ ගිණුම් විෂයයන් 04 කට අදාළ ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන/උපලේඛනවල දැක්වෙන ශේෂ අතර, එකතුව රු. 145,870 ක අසමානතා නිරීක්ෂණය විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | අසමාන වූ ශේෂ පිළිබඳ හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

(ඇ) **විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.140,411,140 ක් වූ ගිණුම් විෂයයන් 05 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම්ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

## 1.4 අනුකූල නොවීම

------------------

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

-----------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| -------------------- | ----------------- | ------------ | ---------------- |
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| (i) රීති 59 | සභා බල ප්‍රදේශය තුළ කර්මාන්ත පිළිබඳ සමීක්ෂණයන් පවත්වා නොතිබුණි. | රීති ප්‍රකාර කටයුතු කළ යුතු යුතුවේ. | සභා බල සීමාව තුළ සමීක්ෂණයක් පවත්වා කර්මාන්ත පිළිබඳ ලැයිස්තුවක් මේ වන විට සකස් කරමින් පවතී. |
| (ii) රීති 218 | සභාවට අයත් සියලු ඉඩම් හා ගොඩනැඟිලි පිළිබඳ සමීක්ෂණයක් පවත්වා නොතිබුණි. | රීති ප්‍රකාර කටයුතු කළ යුතුවේ. | ඉඩම් හා ගොඩනැඟිලි සමීක්ෂණ මණ්ඩලය පත් කර සමීක්ෂණය ආරම්භ කර ඇත. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මු.රෙ.571 | වර්ෂ දෙකක් ඉක්ම වූ රු.147,719 ක් වටිනා තැන්පතු සම්බන්ධව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කළ යුතුවේ. | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කරමි. |
| (ii) මු.රෙ.1645 හා 1646 | වාහන 09 කට අදාළ දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කළ | සියළුම වාහන වල මාසික සාරාංශ විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | යුතුවේ. | |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාව සතු වාහන සම්බන්ධයෙන් ඉන්ධන දහන පරීක්ෂාව කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාර කටයුතු කළ යුතුවේ. | කඩිනමින් ඉන්ධන පරීක්ෂාව සිදු කර නිවැරදි ආකාරයට කටයුතු කරමි. |

**2. මූල්‍ය සමාලෝචනය**

----------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.3,058,865 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.7,350,434 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,798,500 | 1,267,457 | 1,206,899 | 1,167,490 | 1,332,050 | 1,866,640 | 1,656,434 | 1,106,932 |
| කුලී | 3,985,000 | 1,363,365 | 1,377,217 | 3,686 | 4,751,000 | 260,250 | 255,115 | 17,538 |
| බලපත්‍ර ගාස්තු | 243,100 | 255,146 | 254,231 | 2,000 | 214,100 | 166,220 | 167,720 | 1,085 |
| වෙනත් ආදායම් | 5,950,000 | 9,522,903 | 581,413 | 15,954,072 | 7,892,500 | 14,181,458 | 21,812,734 | 7,012,582 |
| එකතුව | 11,976,600 | 12,408,871 | 3,419,760 | 17,127,248 | 14,189,650 | 16,474,568 | 23,892,003 | 8,138,137 |

## 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයට ඇස්තමේන්තුගත ආදායම රු.11,976,600 ක් විය. සමාලෝචිත වර්ෂයේ ආරම්භයට තිබූ රු.8,138,136 ක හිඟ මුදල හා බිල්කිරීම් රු.12,408,871 ක් සමඟ රු.20,547,008 ක් අයවීමට තිබූ අතර වර්ෂය තුළදී මුළු අයවීම් රු.3,419,760 ක් පමණක් වීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ මුදල රු.17,127,248 ක් විය. අයවීම් ප්‍රගතිය සියයට 16 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | හිඟ ශේෂයන් අයකර ගැනීමට කටයුතු කරමි. |

## 2.2.3 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **(අ) <u>වරිපනම්</u>** | | |
| සමාලෝචිත වර්ෂයේ ආරම්භයට හිඟ වරිපනම් බදු ශේෂය රු.1,055,228 ක් වූ අතර, රු.656,222 ක් වූ වර්ෂයේ බිල් කිරීම් සහ අධි ගාස්තු සමඟ රු.1,711,450 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළදී මුළු අයවීම් රු.506,524 ක් වීම නිසා වර්ෂය අවසානයට රු.1,204,926 ක හිඟ ශේෂයක් පැවතුණි. සමාලෝචිත වර්ෂයේ මුළු අයවීම් බිල් කිරීම් හා වර්ෂය ආරම්භයේ හිඟ ශේෂයෙන් සියයට 30 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | වරිපනම් බදු මුදල් කඩිනමින් ගෙවන ලෙස ලිඛිතව දැනුම් දීමට කටයුතු කරමි. |
| **(ආ) <u>අක්කර බදු</u>** | | |
| ආරම්භක හිඟ අක්කර බදු ශේෂය රු.44,954 ක් වූ අතර, වර්ෂයේ බිල්කිරීම් රු.12,345 ක් විය. සමාලෝචිත වර්ෂය තුළ මුළු අයවීම් රු.10,932 ක් වූයෙන්, වර්ෂය අවසානයට රු.46,367 ක් හිඟව පැවතුණි. සමාලෝචිත වර්ෂයේ මුළු අයවීම්, බිල් කිරීම් හා වර්ෂය ආරම්භයේ හිඟ ශේෂයෙන් සියයට 19 ක් තරම් අවම මට්ටමක පැවතුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | ඉඩම් සමීක්ෂණය සිදු කළ වහාම මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |

### 2.2.4 වෙනත් ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.272,050 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.15,428,321 ක මුදලක් අය විය යුතුව තිබුණි. | හිඟ උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු කඩිනමින් අයකර ගත යුතුවේ. | උසාවි දඩ හා මුද්දර ගාස්තු නිසි වේලාවට නොලැබෙන බව ප්‍රධාන ලේකම් වෙත ලිඛිතව දැනුම් දී ඇති බව දන්වමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණ කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **(අ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය** | | |
| සමාලෝචිත වර්ෂයේදී කසළ රැස්කිරීම හා බැහැර කිරීම වෙනුවෙන් රු.2,801,784 ක වියදමක් දරා තිබූ අතර වර්ග කිරීමකින් තොරව සතියකට ටොන් 02 ක් පමණ කසළ අවිධිමත් ලෙස ගොඩපිටියේ පෞද්ගලික ඉඩමකට බැහැර කරමින් තිබුණි. | විධිමත් ලෙස කසළ බැහැර කළ යුතුවේ. | කොම්පෝස්ට් ව්‍යාපෘතියක් සඳහා ඉඩමක් ලබා ගැනීමට කටයුතු කරමින් පවතින අතර, ක්‍රමවත් ව්‍යාපෘතියක් සකස් කරමින් පවතී. |
| **(ආ) තිරසර සංවර්ධන ඉලක්ක** | | |
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ , තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුළින් සහා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟාකර ගැනීමට වැඩසටහන් සැලසුම්කර ක්‍රියාත්මක කළ යුතුවේ. | 2020 අයවැය තුළින් විස්තරාත්මකව එළි දැක්වීමට සැලසුම් කර ඇත. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 05 ක් සම්පූර්ණ කර ගැනීමටත්, 03 ක් වූ අතිරික්ත සේවක සංඛ්‍යාව විධිමත් කර ගැනීමටත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. | කාර්ය මණ්ඩලයේ තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කර ගත යුතුවේ. | පුරප්පාඩු තනතුරු සඳහා අනුමැතිය ලබා ගැනීමෙන් පසු බඳවා ගැනීමට කටයුතු කරන බව සඳහන් කරමි. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂයේදී ද වරිපනම් බදු අය කිරීම 2012 වර්ෂයේ දේපළ තක්සේරුව මත සිදුකර තිබූ අතර 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146(1) ප්‍රකාරව දියුණු ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් අය කිරීමට කටයුතු කර නොතිබුණි. | කඩිනමින් තක්සේරු ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. | නව තක්සේරු සිදු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ලිපි යොමු කර ඇත. |
| (ආ) | 2017 අප්‍රේල් 19 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි අංක 3/2017 හා 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතය මඟින් නිලධාරීන්ගේ කාර්යාලයට පැමිණීම හා පිටවීම සනාථ කිරීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාර කටයුතු කළ යුතුවේ. | යන්ත්‍ර මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවා ඇත. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | වැය විෂයන් 06 ක රු.5,278,589 ක ඉතිරිවීම් තිබුණි. එම අගයන් සියයට 11 සිට සියයට 100 දක්වා පරාසයක පැවතුනි. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළ යුතුවේ. | අදාළ නිලධාරීන් දැනුවත් කර විචලනයන් මඟහරවා ගැනීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ආදායම් විෂයන් 03 ක ළඟාකර නොගත් ඉලක්කවල එකතුව 5,304,028 ක් වූ අතර එම අගයන් සියයට 9 සිට සියයට 65 දක්වා පරාසයක පැවතුනි. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළ යුතුවේ. | අදාළ නිලධාරීන් දැනුවත් කර විචලනයන් මගහරවා ගැනීමට කටයුතු කරමි. |

**4.2** **අභ්‍යන්තර විගණනය**

------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි දැක්වෙන විධිවිධානයන් සහ දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ව.ලේ. දරන චක්‍රලේඛය ප්‍රකාර ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. මුදල් රෙගුලාසි 134 ප්‍රකාර අභ්‍යන්තර විගණන වැඩසටහන් පිළියෙල කිරීමේදී විගණකාධිපතිගේ එකඟත්වය ලබාගෙන නොතිබුණු අතර, අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාර කටයුතු කළ යුතුවේ. | වැඩසටහන් පිළියෙල කිරීමට කටයුතු කරන අතර විගණන වාර්තා යොමු කිරීමට කටයුතු කරමි. |